// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1797/24 – 2013 පෙබරවාරි 15 වැනි සිකුරාදා – 2013.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 07 වෙලේකඩේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක බ/637 හා 2013.01.21 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 ලෙස නිරූපනය කරන ප්‍රමාණයෙන් හෙක්. 0.1288 ක් වූ කුඩාමුත්තෙට්ටුව නමැති ඉඩම.

උතුරට: වී. කේ. සිවසුබ්‍රමනියම් හිමිකම් කියන කුඩාමුත්තෙට්ටුව; නැගෙනහිරට: වී. කේ. සිවසුබ්‍රමනියම් හිමිකම් කියන කුඩාමුත්තෙට්ටුව සහ මු.පි.බ. 229 හි කැබලි අංක 01 සහ 02; දකුණට: මු.පි.බ. 229 හි කැබලි අංක 01, 02 සහ මාර්ගය; බටහිරට: කැප්පෙටිපොල පාර.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මාර්තු මස 6 වැනි දින ප.ව. 2.30 ට බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 පෙබරවාරි මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ගාමිණී මහින්දපාල ජෝපියස්,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

මගේ අංකය: බදු/04/07/109.
2013 පෙබරවාරි මස 11 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 – 230

1A – G 17281 – 345 (2013/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*